සමිර හේරත්

තිසැක ජය අත්වැල

ප්‍රශ්ණ පත්‍ර අංක - 01

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය

කාලය පැය - 03 යි

**උපදෙස් :**

- ප්‍රශ්ණ **පහකට** පමණක් පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්ණයකට හිමි ලකුණු සංඛ්‍යාව 20කි.

පත්‍රය - 2

## 01

1. සන්නිවේදනයේ මූලිකාංග හතරක් නම් කරන්න.
2. ජීව විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කළ සන්නිවේදනසන්නිවේදන ආකෘතියෙහි විශේෂතා හතරක් දක්වා, ඉන් දෙකක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.
3. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ ලක්ෂණ හතරක් දක්වා තුනක් කෙටියෙන් විස්තර කරන්න.
4. සන්නිවේදනයේ අරමුණු හතරක් දක්වා එහි වැදගත්කම පිළිබඳව පැහැදිලි කරන්න.

## 02

1. ප්‍රාථමික සමාජයේ සිටි මානවයන් සන්නිවේදන සඳහා භාවිතා කළ මෙවලම් හා විධි ක්‍රම 05 ක් දක්වන්න.
2. සන්නිවේදනයේ ස්වභාවය පිළිබඳ කරුණු හතරක් දක්වා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.
3. සමූහ සන්නිවේදනයේ ලක්ෂණ හතරක් දක්වා තුනක් කෙටියෙන් විස්තර කරන්න.
4. ඔබ ඇසින් දුටු අනතුරක් තවකෙකුට ප්‍රකාශ කිරීමේදී දක්නට ලැබෙන සන්නිවේදනයේ ලක්ෂණ හතරක් සවිස්තරාත්මකව පැහැදිලි කරන්න.

## 03

1. මහාචාර්ය විල්බර් ශ්‍රාම් ඉදිරිපත් කළ සන්නිවේදන නිර්වචනය ලියා දක්වන්න.
2. අවිධිමත් සන්නිවේදනයේ ප්‍රධාන ලක්ෂණ හතරක් දක්වා දෙකක් සඳහා කෙටි සටහන් ලියන්න.
3. පාලකාට හිතකර ලෙස මාධ්‍ය භාවිතා කළ යුතුය, යන සන්නිවේදන සංකල්පය පිළිබඳ හඳුන්වා එහි මූලික ලක්ෂණ හතරක් දක්වා ඉන් තුනක් විස්තර කරන්න.
4. වර්ථමාන ජනමාධ්‍ය ක්‍රියාවලිය තුළ වාරණය ක්‍රියාත්මක වන විධි හතරක් උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

## 04

1. නිර්වාචික සන්නිවේදනය ගැන කෙටි හැඳින්වීමක් කර, ඊට අධාල ලක්ෂණ හතරක් නම් කරන්න.
2. ජනසන්නිවේදනයේ ලක්ෂණ හතරක් දක්වා දෙකක් පැහැදිලි කරන්න.
3. සන්නිවේදනය පිළිබඳ ගණිතමය ආකෘතිය ඇඳ එහි වඩාත් කැපී පෙනෙන මූලිකාංගය කුමක්දැ යි දක්වා එහි ප්‍රධාන බාධක දෙක නම් කර උදාහරණ සහිතව විස්තර කරන්න.
4. තොරතුරු සම්පාදන කාර්යෙහි වැදගත්කම සම්බන්ධ කරුණු හතරක් පදනම් කරගෙන පුවත්පතකට ලිපියක් ලියන්න.

05

- සන්නිවේදනය පිළිබඳ ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතිය පහත දැක්වෙයි.




1. හැරල් ඩී. ලැස්වෙල්ගේ ආකෘතිය හා මෙම ආකෘතිය අතර දැකිය හැකි වෙනස්කම් හතරක් නම් කරන්න.

2. ඉහත ආකෘතියට අනුව පණිවිඩය සම්ප්‍රේෂණය කරන පාර්ශවය වෙත පෙරළා පණිවිඩයක් නැවත ලැබේ. එම ක්‍රියාවලිය නම් කර, එහි ප්‍රයෝජන හතරක් දක්වන්න.

3. ආකේතකරණය හා විකේතකරණය යන වචන විස්තර කරන්න.

4. සොවියට් සන්නිවේදන සංකල්පය පිළිබඳ  විස්තර කරන්න.

06

1. එඩ්වඩ් ෂැපීර්ගේ හෝ හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ සන්නිවේදන නිර්වචනයක් ලියන්න.

2. ජනමාධ්‍යවල දොරටුපාලකවරුන්ගේ ක්‍රියාකාරිත්වය නිසාවෙන් සිදුවන වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න.

3. සන්නිවේදනයේ මූලිකාංග හතරක් නම් කර විස්තර කරන්න..

4. විධිමත් හා අවිධිමත් සන්නිවේදනයේ ලක්ෂණ වෙන වෙනම හතර බැගින් දක්වා අවිධිමත් සන්නිවේදනයේ දාම හතර උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

07

1. නිදහස් මතවාද සන්නිවේදන සංකල්පයේ ලක්ෂණ හතරක් ලියන්න.

2. නිදහස් අදහස් ප්‍රකාශනයට ඉඩ තිබුණ ද ඉදිරිපත් කරන සංදේශයන්ගේ ගුණාත්මක බව හා සමාජමය වගකීම පිළිබඳ මාධ්‍යකරුවන් වගකිව යුතුය, යන්න සඳහන් සන්නිවේදන සංකල්පය නම් කර විස්තර කරන්න.

3. ශ්‍රව්‍ය හා දෘෂ්‍ය සන්නිවේදනය යන්න පිළිබඳ උදාහරණ සහිතව කෙටි සටහන් ලියන්න.

4. ෂැනොන් හා වීවර්ගේ ආකෘතිය ඇද අනෙක් ආකෘතිවලට වඩා එය සුවිශේෂී වීමට කරුණු හතරක් දක්වා විමසන්න.